**ශ්‍රී ලංකාවේ පැවති මුතු කර්මාන්තය.**

**(පෘතුගීසි, ලන්දේසී, ඉංග්‍රීසි යුග ඇසුරින්)**

ඉෂාරා සුරංජි පෙරේරා[1]

මුතු ; මුක්ත, මුතුහර ලෙසින් ද හඳුන්වන අතර මුතු නිර්මාණය ස්වාභාවික සිදුවන්නා වූ සංසිද්ධියකි. ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකාව මුතු නිසා ප්‍රසිද්ධියට පත්ව තිබූ බව මූලාශ්‍රය පිරික්සීමෙන් පෙනී යයි. පුරාතනයේ සිටම ලංකාව පෙරඅපර දෙදිග වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් වූ නිසා ලංකාවෙන් අපනයනය කළ භාණ්ඩ අතර ප්‍රධාන ස්ථානයක් මුතු වලට හිමි විය. මුතු ලංකාවේ ප්‍රධානතම අපනයන මාධ්‍යයක් වූ බව දේශීය හා විදේශීය සාහිත්‍යය මූලාශ්‍රය පිරික්සීමෙන් පෙනී යයි. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතින් මෙරට නතු කරගෙන සිටි සමයේ දී ද ඔවුන්ගේ ප්‍රධාන ධන උපායන මාර්ග වලින් එකක් වූයේ මුතුය. ඔවුන්ගේ ආගම සමග ද මෙකී කර්මාන්තය බැඳී පැවතිණ. ආගමික බැඳීම මුල් කරගනිමින් මෙකී යුගයන් හී දී මොවුහු මුතු කර්මාන්තයේ නියැලුණු ආකාරය පිළිබඳව මූලාශ්‍රමය සාධක ලැබේ. අතීතයේ ධන උපායන මාර්ගයක් වූ මේ මුතු කර්මාන්තය වර්තමානයේ ලංකාවේ එතරම් සාර්ථක අයුරින් සිදු නොවූවද ලෝකයේ සෙසු රටවල් වල කෘත්‍රිම ක්‍රම අනුගමනය කරමින් වඩාත් සාර්ථක අයුරින් සිදු කරන බව පෙනී යයි. ඒ අනුව බටහිර ජාතිකයන්ට ධන උපායන මාර්ගයක් වූ මේ මුතු කර්මාන්තය පිළිබඳව පරීක්ෂාවට ලක්කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය **අරමුණ** වී ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය** වූයේ මූලාශ්‍රය අධ්‍යයනය කිරීම යි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය රාශියක් කෙරෙහි මෙහිදී අවධානය යොමු විය. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයන් ශ්‍රී ලංකාවේ අරිප්පු, කොණ්ඩච්චි, පොම්පරිප්පු වෙරළ තීරය ආශ්‍රිතව මුතු කර්මාන්තය පවත්වාගෙන ගිය බව පෙනී යන අතර ඔවුන් විශාල ධනස්කන්ධයක් මෙරටින් උපයා ගත්බවත් වර්තමානයේ මිහිතලය උණුසුම් වීම, සාගරයේ උණුසුම යන පාරිසරික සාධක හේතු කොටගෙන මෙන්ම මුතු ලබාගැනීමේ දී නොමේරූ මුතුපර කඩාගැනීමේ අදූරදර්ශී ක්‍රියාව හා ලංකාවේ මුතු බෙල්ලන් බෝවීම මර්දනය වීම නිසා ලංකාවෙන් සම්පූර්ණයෙන්ම මුතුපර නැති වී යාම සිදු වී ඇති බවත් මෙහිදී නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *මුතු, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි*

[1]. ඉතිහාස අධ්‍යයන අංශය, සාමාජීය විද්‍යාපීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. suranjiperera89@gmail.com